## 26 – සුනිල දියේ

සුනිල දියේ වගුරු විලේ කුමුදු පිපෙනවා
නිසල රැයේ සඳෙළියේ සුවඳ හමනවා

ලෝකේ සැමා දෙමැව් පිය සඳේ
සොබා දහමේ ඔබට තුති පිදේ

බට්ති ගිරා කැදලි කරා කඩිසර වෙනවා
සිඟති මුවෝ මව් කුලේ සුවය විඳිනවා

රැයට සඳද හිරු උදයට එළිය බෙදනවා
ගතට වැදී මද නලේ සතුට තියෙනවා

කුරුළු නදේ මිහිර වැදේ දුක දුරු වෙනවා
තුරුළු වෙලා ඔබ වටා ඔබ පසසනවා